# සිංහල භාෂාව හා සාහිත්‍ය තරගාවලිය - 2023
පළාත් මට්ටම

01. අපේක්ෂකයාගේ නම : ..........................................................................................
(මුල්'කුරු සමග නිවැරදි ව ලියන්න)

02. විදුහලේ නම සහ ලිපිනය : ..........................................................................................

03. පාසල් වර්ගය : 200ට අඩු / 201-500 තෙක් /500ට වැඩි

04. කලාපය : ..........................................................................................

05. පළාත : ..........................................................................................

## භාෂා භාවිතය හා අවබෝධය

6 ශ්‍රේණිය

කාලය : පැය 02යි.

I , II කොටස්වල ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.

### I වැනි කොටස

1. අක්ෂර වින්‍යාසය නිවැරදි ව යෙදී ඇති වචනය තෝරා යටින් ඉරක් අඳින්න.

(i) උච්චාරණය / උච්ඡාරණය
(ii) ස්තාවර / ස්ථාවර
(iii) මහලු / මහළු
(iv) චන්දය / ඡන්දය
(v) ලාඤ්ජනය / ලාඤ්චනය
(vi) දක්ශිණාංශය / දක්ෂිණාංශය
(vii) පුළුස්සා / පුලුස්සා
(viii) ශුභාෂිංසන / ශුභාශිංසන
(ix) නිෂ්චල / නිශ්චල
(x) සමස්ත / සමස්ථ

(ලකුණු 1 x 10 = 10 යි)

2. පහත වචනවල තද කළු පැහැයෙන් මුද්‍රිත අකුරේ පිල්ලම නම් කරන්න.

(i) ක**තා**ව ..............................
(ii) ආ**සිරි** ..............................
(iii) **පැ**තුම ..............................
(iv) **ශෛ**ලිය ..............................
(v) **රු**වල ..............................

(ලකුණු 1 x 5 = 05 යි)

3. පහත දක්වෙන වාක්‍යවල හිස්තැනට සුදුසු වචනය වරහනින් තෝරා ලියන්න.

(i) ..............................(නුවණ/නුවන) මෙහෙයවා වැඩ කිරීම දියුණුවට හේතු වෙයි.
(ii) අපේ කලා ශිල්ප අතර සඳකඩ .............................. (පහණ/පහන) විශේෂ නිර්මාණයකි.
(iii) හිරු.............................. (කිරන/කිරණ) ක්‍රමයෙන් මැකී ගියේ ය.
(iv) හිමිදිරියේ හමන මඳ.............................. (නල/නළ) ගත සිත ප්‍රබෝධවත් කරයි.
(v) ..............................(අලුයම/අළුයම) 5.30 ට බස් රථය පාසලින් පිටත් වීමට නියමිත ය.

(ලකුණු 1 x 5 = 05 යි)

4. ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

ගොයම් කපා, පාගා අස්වනු නිවෙස්වලට ගත් පසු වෙල්යාය අපේ කෙළිබිම වෙයි. අවුරුදු කාලයට අප එල්ලේ ක්‍රීඩා කරන්නේ මේ වෙල් එළියේ ය. ගම්මානයේ ගෙවතු සහ අසල කැලෑ රොදවල වැවී තිබුණු මී අඹ , කජු , පේර ආදි ගස් පලබර වී තිබෙන්නේ ගමේ කොවුල කුරුට්ටන්ටත් ලේනුන් සහ නොයෙක් කුරුල්ලන්ටත් අවුරුදු සංග්‍රහය භුක්ති විඳීමට ආරාධනා කරන්නාක් මෙනි.

(i) මෙහි ඇතුළත් මහාප්‍රාණ අක්ෂරයක් යෙදුණු වචනයකි.......................................................

(ii) සඤ්ඤක අක්ෂරයක් සහිත වචනයකි .......................................................

(iii) යුගල පදයකි.......................................................

(iv) උත්තම පුරුෂ බහු වචන අනුක්ත පදයකි.......................................................

(v) කෙළිබිම,තිබුණු යන පදවල තද කළු අකුරින් මුද්‍රිත අකුරු අයත් වන්නේ කවර අක්ෂර ගණයට ද ?

(ලකුණු 1 x 5 = 05 යි)

5. පහත සඳහන් පදවල අනුක්ත පද ලියන්න.

(i) මම - .......................................

(ii) හුනෝ - .......................................

(iii) ඔවුහු - .......................................

(iv) මැස්සෙක් - .......................................

(v) නිළියක් - .......................................

(ලකුණු 1 x 5 = 05 යි)

6. මුලින් දී ඇති පදයට සමානාර්ථවත් පදයක් හා විරුද්ධාර්ථවත් පදයක් ලියන්න.

| | | සමානාර්ථවත් පදය | විරුද්ධාර්ථවත් පදය |
|---|---|---|---|
| (i) | දිළිඳු | ....................................... | ....................................... |
| (ii) | පිරිසිදු | ....................................... | ....................................... |
| (iii) | අසල | ....................................... | ....................................... |
| (iv) | කැමති | ....................................... | ....................................... |
| (v) | රුපු | ....................................... | ....................................... |

(ලකුණු 1 x 10 = 10 යි)

7. උක්ත ආඛ්‍යාත පද සම්බන්ධය නිවැරදි වන සේ හිස්තැනට සුදුසු පදය වරහනින් තෝරා ලියන්න.

(i) .......................................සැමට කරුණාව දක්වමු. (අපි/අප)

(ii) නුඹලා ක්‍රීඩාගාරයේ රැඳී....................................................... (සිටියෙහි/සිටියෙහු)

(iii) තුරු පෙළ මලින් බර වී ....................................... (තිබිණි /තිබුණාහ)

(iv) නාහිමි දහම් දෙසුමට ....................................... (වැඩියේ ය/වැඩියහ)

(v) කළු වලාවෝ ගගන තලය වසා ....................................... (ගත්හ/ගැනිණි)

(vi) ඔවුහු බොහෝ වෙහෙස වී වැඩ.......................................(කළේ ය/කළෝ ය)

(vii) ඇ උදෙන් ම නැගිට මිදුල ....................................... (ඇමදුවා ය/ඇමදුවේ ය)

CamScanner

(viii) ..............................................වැඩ වර්ජනය නිමා කළහ. (වෛද්‍යවරුන්/වෛද්‍යවරු)

(ix) සිවු මහා ..............................................මහ මුහුදට ඇදෙති. (ගංගා/ගංගාවෝ)

(x) පුහුණුකරුවෝ ..............................................ජයග්‍රහණය කරා මෙහෙයවති. (ක්‍රීඩකයෝ/ක්‍රීඩකයන්)

(ලකුණු 1 x 10 = 10 යි)

8. පහත සඳහන් ප්‍රස්තාව පිරුළු සම්පූර්ණ කරන්න.

(i) ..............................................දියේ දැම්මා වාගෙයි.

(ii) බීරි අලින්ට වීණා ..............................................කරනවා වගෙයි.

(iii) අතු කඩා.............................................. කන්නා වගෙයි.

(iv) ගමරාලගේ..............................................වගෙයි.

(v) ලැජ්ජා නැතිකම ..............................................වඩා ලොකුයි.

(ලකුණු 2 x 5 = 10 යි)

## II කොටස

9. පහත දැක්වෙන පැදිපෙළ කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

ගතේ ඇඳුම වැරහැලි වුව කිලිටි පෙවී
කුසේ ගින්න දැනුණද ඉන් ශෝක නොවී
සාදා ගනු පිණිස නැණ නෙත රැකෙන දෙවී
දුවේ පුතේ අකුරට යව් අලස නොවී

නොහිම් දැනුම පිරි හිස පඬිරුවන ලොවේ
ඔටුනු පලන් හිස වුව ඔහු ළඟදී නැවේ
බඳෙහි කිසිත් නැති උණ ගස උසට වැවේ
පැහුණු කරල සේ පඬි හිස බිමට නැවේ

ධනය බලය කොට ගත් අය දුර නොයතී
නැණැස බලය ගත් අය බෝ දුරම යතී
රුවැති පින්න මල ලන්දට තොරණ වෙතී
පුංචි පිච්ච මල ගමකට සුවඳ දෙතී

(i) පද්‍ය පන්තියට සුදුසු මාතෘකාවක් යොදන්න ..............................................
..............................................

(ii) මෙහි " ඔටුනු පලන් හිස " යනුවෙන් කුමක් අදහස් වේ ද ?..............................................
..............................................

(iii) මෙහි දුර යන හා නොයන අය දැක්වෙන්නේ කෙසේ ද ? ..............................................
..............................................

(iv) පද්‍ය පන්තියේ එන උපමාවක් හා උපමේයක් ලියන්න..............................................
..............................................

(v) පහත පදවල අරුත් ලියන්න.

(i) නොහිම .............................................. (ii) ලන්ද..............................................

(ලකුණු 4 x 5 = 20යි)



Downloaded from Past Papers Wiki - Extensive collection of Past papers, Notes and much more! CamScanner

10. පහත දැක්වෙන ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

කෝට්ටේ යුගය සිංහල කවියේ ස්වර්ණමය අවධිය ලෙස සලකන්නේ විවිධ විෂයන්ට අයත් කවි පොත් ගණනාවක් මේ යුගයේ රචනා වූ බැවිනි. සන්දේශ කාව්‍යයන්ට අමතර ව ගුත්තිල කාව්‍යය , කාව්‍යශේඛරය, බුදුගුණ අලංකාරය , ලෝවැඩ සඟරාව , පැරකුම්බා සිරිත , කව් ලකුණු මිණිමල ආදි කවි පොත් එකල බිහි විය. මෙයින් 'කාව්‍යශේඛරය' මහා කාව්‍යයකි. 'ගුත්තිලය' විදග්ධ කවිය හා ජනකවිය මනා ව සම්මිශ්‍ර කොට ගත් සිංහලයේ විශිෂ්ටතම කාව්‍යය ලෙස සැලකේ. එය 'කව්සිළුමිණට' පමණක් දෙවන වන කාව්‍යයක් ලෙස උගත්තු සලකති. ' පැරකුම්බා සිරිත ' සිංහලෙන් රචිත ප්‍රථම ප්‍රශස්ති කාව්‍යය යි. 'බුදුගුණ අලංකාරය ' බමුණන් දැඩි ලෙස උපහාසයට ලක් කරන විවේචනාත්මක රීතියෙන් ලියැවුණු භක්ති කාව්‍යයකි. ' ලෝ වැඩ සඟරාව ' ථේරවාදී දහම මත පිහිටා ලෞකික ජීවිතයේ නිසරු බව විදහා පාන්නකි. කව්ලකුණු මිණිමල කාව්‍ය ශාස්ත්‍රය පිළිබඳ ලියැවුණකි.

(i) කෝට්ටේ යුගය, සිංහල කවියේ ස්වර්ණමය අවධිය ලෙස සැලකෙන්නේ ඇයි ?

.................................................................................................................................

.................................................................................................................................

(ii) 'ගුත්තිලය' සිංහලයේ විශිෂ්ටතම කාව්‍යය ලෙස සැලකීමට හේතුව කුමක් ද ?

.................................................................................................................................

.................................................................................................................................

(iii) සිංහලෙන් රචිත ප්‍රථම ප්‍රශස්ති කාව්‍යය නම් කරන්න.

.................................................................................................................................

.................................................................................................................................

(iv) 'බුදුගුණ අලංකාරය ' කෘතියෙහි ඇති විශේෂත්ව දෙකක් ලියන්න.

.................................................................................................................................

.................................................................................................................................

(v) පහත වචනවල අර්ථය ලියන්න.

(අ) විදග්ධ ..........................................................................

(ආ) ලෞකික ..........................................................................

(ලකුණු 4 x 5 = 20 යි)

PAST PAPERS WIKI



CamScanner